" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

243

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2021 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2021.11.25

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්ටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක **GOS/ADM/12/8/19** හා **2021.11.24** දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2021.10.07 MH/TA/G/PSM/05/2020 | කොවිඩ් 19වසංගත කාල සීමාවේදී ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල නිරත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අතිකාල දීමනා ලබා දීම. |
| 02 | 2021.10.07 01-33/2021 | 1997.01.01 දිනෙන් පසු විශ්‍රාම ගිය ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් නොලැබීම. |
| 03 | 2021.10.05 02-75/2021 | ශ්‍රී ලංකා හෙද සේවයේ ශ්‍රේණිගත උසස්වීම් සඳහා සලකා බලනු ලබන කාලසීමාව සංශෝධනය කිරීම. |
| 04 | 2020.01.17 01-07/2020 | මහජන සෞඛ්‍ය හෙද සොයුරියන් සහ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් (ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම්)සඳහා වූ මාසික බිල්පත් නිරවුල් කිරීමට අනුමැතිය ලබා දීම. |
| 05 | 2021.05.21 09/2021 (රා.ප. චක්‍රලේඛයකි) | උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා නිවාඩු ලබා දීම. |
| 06 | 2021.06.30 14/2021 (රා.ප. චක්‍රලේඛයකි) | ජාතික ක්‍රීඩා දිනය ප්‍රකාශයට පත් කිරීම. |
| 07 | 2021.10.22 02/2021 (රා.ප. චක්‍රලේඛයකි) | කොවිඩ් 19 ආසාධිත රජයේ නිලධරයන් සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම. |

| | | |
|---|---|---|
| 08 | 2021.11.05<br>23/2021<br>(රා.ප. චක්‍රලේඛයකි) | රාජ්‍ය ආයතනවල නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත "ඉ-ග්‍රාම නිලධාරි " පද්ධතියට ඇතුලත් කිරීම. |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවති,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

225


...ශන් / ...one ) 0112698507 , 0112694033
) 0112675449 , 0112675280

...ක්ස් / ...க்ஸ் / Fax ) 0112693866
) 0112693869
) 0112692913

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
## சுகாதார அமைச்சு
## Ministry of Health

මගේ අංකය / எனது இல / My No ) R/AMO/A/01/2013 D

ඔබේ අංකය / உமது இல / Your No )

දිනය / திகதி / Date ) 2021. 09 08

Adm-7 / 138-3
21 SEP 2021

AO

පොදු චක්‍රලේඛ අංක : **01-33/2021**

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
අධ්‍යක්ෂ ,ජාතික රෝහල කොළඹ/මහනුවර,
සියළුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම පළාත් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් මහරෝහල් අධ්‍යක්ෂවරුන්,
සියළුම මහ රෝහල් වෛද්‍ය අධිකාරීවරුන්,
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**1997.01.01 දිනෙන් පසු විශ්‍රාම ගිය ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප නොලැබීම.**

2004.02.03 දිනැති සෞඛ්‍ය පොදු චක්‍ර ලේඛ අංක 01 – 02/2004 සහ 2005/09/14 දිනැති සෞඛ්‍ය පොදු චක්‍රලේඛ අංක 02/130/2005 කෙරේ ඔබගේ අවධානය යොමු කරවමි. එම චක්‍රලෙඛයන්හී ලියාපදිංචි වෛද්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නිසි වැටුප් පරිමාණයක් හඳුන්වා නොදීම මත අසාධාරණයට ලක්ව තිබූ 1997.01.01 දින සිට 2005.12.31 දින දක්වා විශ්‍රාම ගිය ලියාපදිංචි වෛද්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නිසි වැටුප් පරිමාණයක් 2021.06.07 දින රැස්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරනය කර ඇති බව අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක.අමප/**21/0945/309/057** හා 2021.06.15 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

02. ලියාපදිංචි වෛද්‍ය නිලධාරී විශේෂ ශ්‍රේණිය සඳහා සෞඛ්‍ය පොදු චක්‍රලේඛ 01-02/2004 යටතේ 213840 – 8 ×6480 – 265680 වැටුප් පරිමානයන්, සෞඛ්‍ය පොදු චක්‍රලේඛ 02 -130/2005 යටතේ 256600 – 8 × 7800 – 319000 වැටුප් පරිමානයන් අදාල කර ගෙන එම චක්‍රලේඛ විධි විදාන වලට අනුව විශ්‍රාම වැටුප්, වැන්දඹු අනත්දරු, වැන්දඹු පුරුෂ සහ අනත්දරු වැටුප් සකස් කර හිඟ මුදල් ගෙවීමට අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇත.

03. ඉහත නියමයන්ට අනුකූලව 1997.01.01. දින සිට 2005.12.31 විශ්‍රාම ගිය විශේෂ ශ්‍රේණියේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් වැන්දඹු අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු වැටුප සකස් කර හිඟ මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමු.

04. මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය මඟින් ඔවුන් විශ්‍රාම ගන්නා විට පළාත් රාජ්‍ය සේවයට අයත් ආයතනයක සේවය කලේ නම් අදාල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතද, මධ්‍යම අමාත්‍යාංශයකට අයත් ආයතනයක සේවය කලේ නම් අදාල ආයතන භාර නිලධාරියා වෙතද ඉදිරිපත් කිරීම මඟින් ඉදිරි කටයුතු කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීමට කාරුණික වන්න.

වෛද්‍ය එස්.එච්.මුණසිංහ
ලේකම්

වෛද්‍ය එස්. එච්. මුණසිංහ
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් :
01. ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය - දැ.ගැ.පි
02. ලේකම්, රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - අ.ක.ස
03. ආයතන අධ්‍යක්ෂ ජනරාල්
04. අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාම වැටුප් - අ.ක.ස
05. රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරී සංගමය - දැ.ගැ.පි

2021/09/21

**1997.01.01 දින සිට 2005.12.31 දක්වා විශ්‍රාම ගිය විශේෂ ශ්‍රේණියේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවය සැකසීමේ අයදුම් පත්‍රය.**

1. නිලධාරියා/නිලධාරිණියගේ පෞද්ගලික තොරතුරු.

   i. නිලධාරියා/නිලධාරිණියගේ සම්පූර්ණ නම : ..........................................................................................................................................

   ii. පෞද්ගලික ලිපිනය : ..........................................................................................................................................

   iii. පෞද්ගලික දුරකථන අංකය : ..........................................................

   iv. උපන්දිනය : ..........................................................

   v. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................

2. නිලධාරියා/නිලධාරිණිය මියගොස් ඇත්නම් වැන්දඹු අනත්දරු හිමි අයගේ තොරතුරු.

   i. සම්පූර්ණ නම : ..........................................................................................................................................

   ii. පෞද්ගලික ලිපිනය : ..........................................................................................................................................

   iii. පෞද්ගලික දුරකථන අංකය : ..........................................................

   iv. උපන්දිනය : ..........................................................

   v. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................

   vi. නිලධාරියාට ඇති ඥාතීත්වය : ..........................................................

3. නිලධාරියා/නිලධාරිණියගේ රැකියාව පිළිබඳ තොරතුරු.

   i. මුල් පත්වීම් දිනය : ..........................................................

   ii. විශේෂ ශ්‍රේණියට පත්වූ දිනය : ..........................................................

   iii. විශ්‍රාම ලබා ගත් දිනය : ..........................................................

   iv. විශ්‍රාම ගන්නාවිට ලබා ගත් අවසන් වැටුප : ..........................................................

   v. විශ්‍රාම වැටුප් අංකය : ..........................................................

   vi. දැනට ලබන විශ්‍රාම වැටුප : ..........................................................

4. නිලධාරියා/නිලධාරිණියගේ සේවා ස්ථානය පිළිබඳ තොරතුරු.

   i. අවසන් වරට සේවය කල ආයතනය : ..........................................................

   ii. එම ආයතනය අයත් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය : ..........................................................

   iii. විශ්‍රාම වැටුප ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..........................................................

- **විශ්‍රාම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවීමට කටයුතු කරන්න.**

මා විසින් මෙහි ඉහත සඳහන් 01 සිට 04 දක්වා දී ඇති තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

.......................................... ..........................................

දිනය අයදුම්කරුගේ අත්සන